**කොළඹ විශ්වවිද්‍යාලය**

**2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන් සහ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

2026 වර්ෂය සඳහා පහත සඳහන් භාණ්ඩ හා සේවා ප්‍රතිපාදනය සහ සැපයීම උදෙසා ශ්‍රී පාලි මණ්ඩපය (හොරණ) , තාක්ෂණ පීඨය (පිටිපන) , හෙද පීඨය (ශ්‍රී ජයවර්ධනපුර) දේශීය වෛද්‍ය පීඨය (රාජගිරිය) ඇතුළු කොළඹ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමට කැමති ප්‍රසිද්ධ සැපයුම්කරුවන් / නිෂ්පාදකයින් / දේශීය නියෝජිතයින් / කොන්ත්‍රාත්කරුවන්ගෙන් මාර්ගගත ක්‍රමයට අයදුම්පත් කැඳවනු ලැබේ.

අභිලාෂී අයදුම්කරුවන්ට අදාල ගූගල් ආකෘතියෙහි දක්වා ඇති ලියාපදිංචි ගාස්තු ගෙවා අදාළ කොටුවේ පැහැදිලිව (✓) යෙදීමෙන් කාණ්ඩ එකක් හෝ කිහිපයක් සඳහා අයදුම් කළ හැකිය. එසේ අයදුම් කරන එක් එක් කාණ්ඩය සඳහා රු. 2,000.00 බැගින් වූ ආපසු නොගෙවන ලියාපදිංචි ගාස්තුවක් ගෙවිය යුතුය. එම ආපසු නොගෙවන ගාස්තුව **මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින්, යොමු අංක 505170600013 භාවිත කරමින්, මහජන බැංකුවේ තිඹිරිගස්යාය ශාඛාවේ පිහිටි කොළඹ විශ්වවිද්‍යාලයේ "ප්‍රධාන රැස් කිරීමේ ගිණුමට"** ගෙවිය යුතුය. ගෙවීම් සිදුකළ බවට සනාථ කරන බැංකු තැන්පතු පත්‍රිකාව අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. මුදල් ඇණවුම්, මාර්ගගත හුවමාරුව, CDM හෝ චෙක්පත් මගින් කරන ගෙවීම් පිළිනොගන්නා බව කරුණාවෙන් සලකන්න.

අයදුම්පත් භාරගනු ලබන්නේ භාණ්ඩ හා සේවා සැපයීමේ ද, මෝටර් රථ අලුත්වැඩියාව සහ සේවා පිළිබඳව ද වසර 3 කට වැඩි පළපුරුද්දක් ඇති අයගෙන් පමණි. ව්‍යාපාර ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක්, වැට් බදු ලියාපදිංචි සහතිකය (මෑතකදී දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් සහතික කර තිබිය යුතුය), CIDA සහතිකය සහ අතීත කාර්ය සාධනය සනාථ කරන අනෙකුත් ලිඛිත සාක්ෂි අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. ලියාපදිංචිය සඳහා ඉල්ලුම් කරන රජයේ දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා හෝ අර්ධ රාජ්‍ය ආයතන ඉහත ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. යෝග්‍යතාවය රහිත අයදුම්කරුවන්ගේ ලියාපදිංචි ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

ඉල්ලා සිටින විට මිල ගණන් ඉදිරිපත් කිරීමට සහ නියමිත වේලාවට භාණ්ඩ හෝ සේවා සැපයීමට අපොහොසත් වන හෝ නියමිත පිරිවිතරයන්ට අනුකූල නොවන, බාල තත්ත්වයේ භාණ්ඩ සැපයීම යනාදිය සිදු කරන සැපයුම්කරුවන්ව පෙර දැනුම්දීමකින් තොරව ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිල ගණන් කැඳවනු ලබන්නේ ලියාපදිංචි සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගෙන් වුවද, අනෙකුත් සැපයුම්කරුවන්/කොන්ත්‍රාත්කරුවන්ගෙන් ද මිල ගණන් කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. තවද කොළඹ විශ්වවිද්‍යාලය විසින් තැපෑලෙන්, විද්‍යුත් තැපෑලෙන් සහ Promise.lk හරහා සාමාන්‍යයෙන් අදාළ කාණ්ඩවල ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලැබේ. එබැවින් Promise.lk (ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන (eGP) පද්ධතිය) හි ලියාපදිංචි වන ලෙස කොළඹ විශ්වවිද්‍යාලයේ ලියාපදිංචි වීමේ අභිලාෂය සහිත සියලුම සැපයුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

2025 දෙසැම්බර් 05හෝ ඊට පෙර ආපසු නොගෙවන ගාස්තු ගෙවීමේ කුවිතාන්සියේ පරිලෝකිත (scanned) පිටපතක් සහ වෙනත් අදාළ ලියකියවිලි උඩුගත කිරීමෙන් පසු www.cmb.ac.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගත අයදුම්පත පිරවිය යුතුය.

දැන්වීම සහ ගූගල් ආකෘති සබැඳිය විවෘත කිරීමට **QR** කේතය පරිලෝකනය කරන්න.

**සභාපති**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව**
**94, කුමාරතුංග මුනිදාස මාවත,**
**කොළඹ 03.**

**දුර. අංක : 011-2055498/011-2503394**
**ෆැක්ස් අංක: 011-2503394**